# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2074/11 - 2018 ජුනි මස 05 වැනි අඟහරුවාදා - 2018.06.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපති විධානය

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එතුමාගේ සභාපතීත්වයෙන් උතුරු-නැගෙනහිර පළාත්හි සංවර්ධන කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසුවිපරම පිණිස කාර්යසාධක බලකායක් පත් කරලීම.

1. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා - අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය
2. ගරු මංගල සමරවීර මැතිතුමා - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය
3. ගරු ඩී. එම්. ස්වාමිනාදන් මැතිතුමා - නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය
4. ගරු මනෝ ගනේසන් මැතිතුමා - ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍ය
5. ගරු කබීර් හෂීම් මැතිතුමා - මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය
6. ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය
7. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා - ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය
8. ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා - සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය
9. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා - නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය
10. ගරු මහින්ද සමරසිංහ මැතිතුමා - වරාය හා නාවික කටයුතු අමාත්‍ය
11. ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය
12. ගරු මහින්ද අමරවීර මැතිතුමා - කෘෂිකර්ම අමාත්‍ය
13. ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය
14. ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා - විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය
15. ගරු රාවුෆ් හකීම් මැතිතුමා - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය

16. ගරු දුමින්ද දිසානායක මැතිතුමා - වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය
17. ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා - ආණ්ඩුකාරවර, උතුරු පළාත
18. ගරු රෝහිත බෝගොල්ලාගම මැතිතුමා - ආණ්ඩුකාරවර, නැගෙනහිර පළාත
19. ගරු සී. වී. විග්නේස්වරන් මැතිතුමා - ප්‍රධාන අමාත්‍ය, උතුරු පළාත් සභාව
20. ගරු ප්‍රධාන අමාත්‍ය - නැගෙනහිර පළාත් සභාව
21. ගරු ඒ. එච්. එම්. ෆවුසි මැතිතුමා - ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබඳ රාජ්‍ය අමාත්‍ය
22. ගරු කේ. කාදර් මස්තාන් මැතිතුමා - පාර්ලිමේන්තු මන්ත්‍රී (වන්නි)
23. ඔස්ටින් ප්‍රනාන්දු මහතා - ජනාධිපති ලේකම්
24. ඊ. එම්. එස්. බී. ඒකනායක මහතා - අග්‍රාමාත්‍ය ලේකම්
25. ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා - ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
26. පී. සුරේෂ් මහතා - ලේකම්, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය
27. එම්. වයි. එස්. දේශප්‍රිය මහතා - ලේකම්, ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය
28. ඩී. සී. දිසානායක මහතා - ලේකම්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
29. ආචාර්ය බී. එම්. එස්. බටගොඩ මහතා - ලේකම්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
30. ඩබ්ලිව්. එච්. කරුණාරත්න මහතා - ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
31. පී. එච්. ජේ. බී. සුගතදාස මහතා - ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
32. එල්. පී. ජයම්පති මහතා - ලේකම්, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය
33. ඩී. කේ. ආර්. ඒකනායක මහත්මිය, ලේකම්, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
34. බී. විජයරත්න මහතා - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
35. කේ. ඩී. එන්. ආර්. අසෝක මහතා - ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
36. ඩබ්ලිව්. එම්. කේ. එස්. ඩී. විජයබණ්ඩාර මහත්මිය - ලේකම්, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
37. බර්නාඩ් වසන්ත මහතා - ලේකම්, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
38. ඩී. ජී. එම්. වී. හපුආරච්චි මහතා - ලේකම්, නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය
39. එන්. ඒ. සිසිර කුමාර මහතා - ලේකම්, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
40. ඒ. පතිනාදන් මහතා - ප්‍රධාන ලේකම්, උතුරු පළාත
41. ඩී. එම්. සරත් අබේගුණවර්ධන මහතා - ප්‍රධාන ලේකම්, නැගෙනහිර පළාත
42. ලුතිනන් ජෙනරාල් එන්. යූ. එම්. එම්. ඩබ්ලිව් සේනානායක මහතා - යුද්ධ හමුදාපති
43. වයිස් අද්මිරාල් සිරිමෙවන් රණසිංහ මහතා - නාවික හමුදාපති
44. එයාර් මාර්ෂල් කපිල ජයම්පති මහතා - ගුවන් හමුදාපති
45. පූජිත් ජයසුන්දර මහතා - පොලිස්පති
46. මේජර් ජෙනරාල් දර්ශන හෙට්ටිආරච්චි මහතා - යාපනය ආරක්ෂක සේනා ආඥාපති
47. මේජර් ජෙනරාල් සන්තුසිත පනන්වල මහතා - නැගෙනහිර ආරක්ෂක සේවා ආඥාපති
48. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

වෙතය,

ශුභාශිංසන පූර්වකවයි !

වසර 26 ක් පැවති ගැටුම්කාරී තත්ත්වය නිමාවට පත්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්හි මෙතෙක් දියත් කරන ලද සංවර්ධන ව්‍යාපෘති සමාලෝචනය කරලීම,

එකී පළාත් හි ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කරලීම,

රජය විසින් එකී පළාත්හි ආරම්භ කෙරුණු සංවර්ධන ක්‍රියාකාරකම් වලට අදාළව අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා උපදෙස් සලසාලීම,

ජාතික සමගිය හා ඒකාබද්ධතාවය, සමබර ආර්ථික, සමාජයීය හා ආදායම් වර්ධනයක් නිර්මාණයට සංවර්ධන ක්‍රියාදාම මගිනී ප්‍රවිෂ්ඨ වීම පිණිස

කාර්යසාධක බලකායක් ස්ථාපනය කරලීම රජයේ අපේක්ෂාව වන හෙයින් ද,

තවද, ජාතික සමගිය හා ඒකාග්‍රතාවය අරබයාත්, සමතුලිත ආර්ථික, සමාජයීය හා ආදායම් වර්ධනයක් නිර්මාණය කරලනු පිණිසත් සංවර්ධන ක්‍රියාදාමය තුළින් අවකාශ සලසාලීම අත්‍යවශ්‍ය බැව් සලකනු ලබන හෙයින් ද,

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය, හා පක්ෂපාතීත්වය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ සභාපතීත්වයෙන් යුතුව උතුරු හා නැගෙනහිර පළාත්හි සංවර්ධනය මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසුවිපරම පිණිස පිහිටුවනු ලබන ජනාධිපති කාර්යසාධක බලකායෙහි සාමාජිකයන් ලෙස පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම් :

1. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා - අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය
2. ගරු මංගල සමරවීර මැතිතුමා - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය
3. ගරු ඩී. එම්. ස්වාමිනාදන් මැතිතුමා - නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය
4. ගරු මනෝ ගනේසන් මැතිතුමා - ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍ය
5. ගරු කබීර් හෂීම් මැතිතුමා - මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය
6. ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය
7. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා - ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය
8. ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා - සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය
9. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා - නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය
10. ගරු මහින්ද සමරසිංහ මැතිතුමා - වරාය හා නාවික කටයුතු අමාත්‍ය
11. ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය
12. ගරු මහින්ද අමරවීර මැතිතුමා - කෘෂිකර්ම අමාත්‍ය
13. ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය
14. ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා - විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය
15. ගරු රාවුෆ් හකීම් මැතිතුමා - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය
16. ගරු දුමින්ද දිසානායක මැතිතුමා - වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය
17. ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා - ආණ්ඩුකාරවර, උතුරු පළාත
18. ගරු රෝහිත බෝගොල්ලාගම මැතිතුමා - ආණ්ඩුකාරවර, නැගෙනහිර පළාත
19. ගරු සී. වී. විග්නේස්වරන් මැතිතුමා - ප්‍රධාන අමාත්‍ය, උතුරු පළාත් සභාව
20. ගරු ප්‍රධාන අමාත්‍ය - නැගෙනහිර පළාත් සභාව
21. ගරු ඒ. එච්. එම්. ෆවුසි මැතිතුමා - ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබඳ රාජ්‍ය අමාත්‍ය
22. ගරු කේ. කාදර් මස්තාන් මැතිතුමා - පාර්ලිමේන්තු මන්ත්‍රී (වන්නි)
23. ඔස්ටින් ප්‍රනාන්දු මහතා - ජනාධිපති ලේකම්
24. ඊ. එම්. එස්. බී. ඒකනායක මහතා - අග්‍රාමාත්‍ය ලේකම්
25. ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා - ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
26. පී. සුරේෂ් මහතා - ලේකම්, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය
27. එම්. වයි. එස්. දේශප්‍රිය මහතා - ලේකම්, ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය
28. ඩී. සී. දිසානායක මහතා - ලේකම්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
29. ආචාර්ය බී. එම්. එස්. බටගොඩ මහතා - ලේකම්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
30. ඩබ්ලිව්. එච්. කරුණාරත්න මහතා - ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
31. පී. එච්. ජේ. බී. සුගතදාස මහතා - ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
32. එල්. පී. ජයම්පති මහතා - ලේකම්, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය
33. ඩී. කේ. ආර්. ඒකනායක මහත්මිය, ලේකම්, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
34. බී. විජයරත්න මහතා - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
35. කේ. ඩී. එන්. ආර්. අසෝක මහතා - ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
36. ඩබ්ලිව්. එම්. කේ. එස්. ඩී. විජයබණ්ඩාර මහත්මිය - ලේකම්, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
37. බර්නාඩ් වසන්ත මහතා - ලේකම්, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

38. ඩී. ජී. එම්. වී. හපුආරච්චි මහතා - ලේකම්, නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය
39. එන්. ඒ. සිසිර කුමාර මහතා - ලේකම්, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
40. ඒ. පතිනාදන් මහතා - ප්‍රධාන ලේකම්, උතුරු පළාත
41. ඩී. එම්. සරත් අබේගුණවර්ධන මහතා - ප්‍රධාන ලේකම්, නැගෙනහිර පළාත
42. ලුතිනන් ජෙනරාල් එන්. යූ. එම්. එම්. ඩබ්ලිව් සේනානායක මහතා - යුද්ධ හමුදාපති
43. වයිස් අද්මිරාල් සිරිමෙවන් රණසිංහ මහතා - නාවික හමුදාපති
44. එයාර් මාර්ෂල් කපිල ජයම්පති මහතා - ගුවන් හමුදාපති
45. පූජිත් ජයසුන්දර මහතා - පොලිස්පති
46. මේජර් ජෙනරාල් දර්ශන හෙට්ටිආරච්චි මහතා - යාපනය ආරක්ෂක සේනා ආඥාපති
47. මේජර් ජෙනරාල් සන්තුසිත පනන්වල මහතා - නැගෙනහිර ආරක්ෂක සේවා ආඥාපති
48. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

වන ඔබතුමන්ලා උතුරු හා නැගෙනහිර පළාත්හි සංවර්ධන කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසුවිපරම පිණිස පිහිටුවන ලබන කාර්යසාධක බලකායෙහි සාමාජිකයන් ලෙස මෙයින් පත්කරනු ලබන අතර පහත (අ) සිට (උ) දක්වා වන කර්තව්‍යයන් ක්‍රියාත්මක කරලීමට අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් විධානය කරමි.

(අ) උතුරු හා නැගෙනහිර පළාත්හි දැනට ක්‍රියාත්මක කෙරෙන විවිධ ආංශික සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් හි ප්‍රගති තත්ත්වය සමාලෝචනය කරලීම ;

(ආ) ප්‍රමුඛත්ව අවධානය යොමුවිය යුතු අංශයන් සහ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් නව සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති මූලාරම්භ කරලීම සහ සම්පාදනය කරලීම සහ ව්‍යාපෘති/වැඩසටහන් සඳහා මූල්‍ය සම්පත් සලසාලීම හා සෙසු කාර්යයන් පහසු කරලීම ;

(ඇ) මෙකී පළාත්හි සියලුම සංවර්ධන ක්‍රියාකාරකම් වලට අදාළ කටයුතු වලදී අවශ්‍ය පරිදි මැදිහත් වීම හා මෙහෙයවීම ;

(ඈ) මෙකී පළාත් දෙකෙහි සංවර්ධන ව්‍යාපෘතීන් සහ වැඩසටහන්හි ආයෝජනය කිරීමත් සහ ඒවා ක්‍රියාත්මක කිරීමත් පිණිස පෞද්ගලික අංශයෙහි, ද්විපාර්ශවීය සහ බහුපාර්ශවීය සංවර්ධන ආයතනයන්හි සහාය සහ සහභාගීත්වය ලබා ගැනීම දිරිගැන්වීම ;

(ඉ) රජය සහ පළාත් පරිපාලනය අතරත්, රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සහ රාජ්‍ය නොවන හා සිවිල් සමාජ අංශයන් අතරත් කටයුතු සම්බන්ධීකරණය කරලීම ;

(ඊ) එම ප්‍රදේශයන්හි සංවර්ධන ක්‍රියකාරකම් ක්‍රියාවට නංවාලීමේ සමස්ථ පසුවිපරම් කටයුතු ඉටුකරලීම ;

(උ) එකී පළාත්හි සංවර්ධන වැඩසටහන් කඩිනමින් ක්‍රියාවට නංවාලීම වළක්වාලන යම් සම්බාධක හඳුනා ගැනීම සහ ඒවා මගහරවාලමින් කඩිනම් විසඳුම් සලසාලනු පිණිස අදාළ බලාධිකාරීන්ට උපදෙස් ලබාදීම ;

තවද, **වී. සිවඥානසෝති මහතා කාර්යසාධක බලකායෙහි ලේකම්වරයා ලෙස පත් කරමි.**

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට උතුරු හා නැගෙනහිර පළාත්හි සංවර්ධන කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසුවිපරම පිණිස පිහිටුවනු ලබන කාර්යසාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තවද, උතුරු හා නැගෙනහිර පළාත්හි සංවර්ධන කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසුවිපරම පිණිස පිහිටුවනු ලබන කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් තොරතුරු ලබාගනු පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස් වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයිද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

වර්ෂ දෙදහස් දහඅටක් වූ ජූනි මස 05 වන දින මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

සුමිත් අබේසිංහ,
වැඩබලන ජනාධිපති ලේකම්.

06 - 802

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.